ද මැසිනොද් විද්‍යාලය කඳාන
De Mazenod College - Kandana

# සිංහල භාෂාව I

පැය 3

2016 . 12 . 01 13 ශ්‍රේණිය

❖ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
❖ පහත සඳහන් උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1 (අ) ඉක්බිති රජ්ජුරුවෝ බලසෙනඟ පිරිවරා මහත් වූ රාජානුභාවයෙන් යුක්ත ව යුවරජ්ජුරුවන්ගේ මාළිගාවට අවුත් වන්හ. එකල්හි යුවරජ්ජුරුවන් හා ඇමෙණියෝ රජ්ජුරුවන්ට පෙරගමන් කොට වැඳ එකත්පස් ව සිටියහ. එවේලෙහි රජ්ජුරුවෝ දෙව්ලොවින් බට දෙවඟනක සේ රූපශ්‍රීන් දිලිහි දිලිහි සිටි අශෝකමාලා දේවීන් දැක මහත් වූ සන්තෝෂයට පැමිණ 'පන්වත් අශෝකමාලාදේවීන් තෙපි ද'යි විචාළහ. එබසට කුමාරිකාවන් 'එසේය ස්වාමීනි'යි බැණ නැඟි බස හා සමඟ මුඛයෙන් නික්මුණා වූ මහනෙල්මල් සුවඳ සියලු රාජභවනයෙහි එකපැහැර පැතිර සිටගත. රජ්ජුරුවෝ ඒ ආශ්චර්යය දැක සන්තුෂ්ට වූවාහු පනවන ලද රාජාසනමස්තකයෙහි බැස උන්හ. මෙසේ රජ්ජුරුවන් උන් කල්හි අශෝකමාලාදේවී තමන් සිය අතින් පිළියෙළ කරන ලද නොයෙක් රසයෙන් උද්දාම වූ රසමසවුලෙන් යුක්ත සුවඳහැල් සාලේ බත් රජ්ජුරුවන් පෙරට තබා තමු ම බත් අනුභව කැරවූහ. රසයෙන් උද්දාම වූ නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත බත් අවුළු ආදිය මෙහෙ නිමවා සතුටු වූ රජ්ජුරුවෝ 'මෙබඳු මේ කුමාරිකාව පරීක්ෂා නොකොට මපුතණුවන් කෙරෙන් මඳකින් පහකෙළෙම් වෙමි'යි සිතමින් දෙමහල්ලන් ළඟට කැඳවා....

(i). රජු යුව රජුගේ මාළිගාවට පැමිණියේ කෙසේද?
(ii). රජු අශෝකමාලාවන් දැක සතුටට පත්වූයේ ඇයි?
(iii). 'සිය අතින්'
'රාජාසනමස්තකයෙහි' යන පදවල ව්‍යාකරණ ලක්ෂණය දක්වන්න.
(iv). ඉහත දී ඇති ඡේදයේ සඳහන් උපමාවක් උපුටා.

(ආ) එවේලෙහි සක් දෙව් රජ භයානක වේශයක් ගෙන භය ගන්නා ලද වජ්‍රායුධ ඇති ව ආකාශයෙහි සිට රාක්ෂසයා භය ගන්වා මා අත ගලවා ඔහු දිව දමින් මසා මතු නොඑන පරිද්දෙන් පර්වත තුන් වැනි වළල්ලෙහි එළා ශක්‍රදේවේන්ද්‍ර තෙම දිව්‍ය ලෝකයට ම ගියේ ය. එකල්හි "මම ශක්‍රයා නිසා ජීවිත දානය ලැබ මාගේ ජීවිතයටත් වඩා මට ප්‍රිය ව සිටි නුඹ වහන්සේ ලදිමි"යි සම්බුලාවන් කී කල්හි සොත්ථිසේන රජ්ජුරුවෝ කියන්නාහු "එම්බා සොඳුර ගෑනුන් කෙරෙහි සබවසෙක් නම් අහසට පොළොව සේ ද සමුදයට එතර මෙතර සේ ද දුරින් දුරු වන්නේ ය. ඒ හිමාල වන ප්‍රදේශය වූ කලී බොහෝ වූ වල් වැද්දන්ගෙන් හා තාපසවරුන් සිද්ධවිද්‍යාධරයන්ගෙන් ගැවසී ගත්තේ ය. තොප කියන බස් කවර කෙනෙක් අදහා ගනිත් දැ"යි කියන්නා වූ රජ්ජුරුවෝ "සොර වූ ස්වභාව ඇති ක්ෂණ ක්ෂණයෙහි නොයෙක් සිතන හෙයින් බහුබුද්ධි වූ මේ ස්ත්‍රීන් කෙරෙහි සබවසෙක් නම් නැත්තේ ය.

(i) සක්දෙවියන් රාක්ෂසයා බියට පත් කළේ කෙසේ ද?
(ii) රාක්ෂසයාට නැවත පැමිණිය නොහැකි වන ලෙස ශක්‍රයා කුමක් කළේ ද?
(iii) රජතුමා පැවසූ පරිදි හිමාල වනයේ සිටින්නේ කවුරුන් ද?
(iv) **'වජ්‍රායුධ' 'බහුබුද්ධි'** යන වචනවලට අර්ථ සපයන්න.

Learning Resource Center R De Mazenod College Kandana

(ඉ) මෙසේ වසන්නා වූ සත්ත්වයන් දාවල් දවස රාජ සේවකයෝ දක අල්වා ගෙන අතමිට තුබූ දෙය උදුරා ගෙන මරා තළා බොහෝ ගැහැට කරන්නාහ. රාත්‍රියෙහි සොරහු ද සත්ත්වයන් උන් තැනින් තැන බලා අල්වා ගෙන බොහෝ ව්‍යසනයට පමුණුවන්නාහ. මෙපරිද්දෙන් සත්ත්වයන්ට කිසි අස්වැසිල්ලක් නැති ව මහත් වූ දුකින් පෙළෙමින් වසන කල්හි පුරන ලද බෝධිසම්භාර ඇති අප මහ බෝධිසත්ත්වයෝ එනුවර සමීපයෙහි ගැට තිඹිරි ගසෙක්හි රුක් දෙව් ව උපන්නාහ. එකල්හි එනුවර රජ්ජුරුවෝ ඒ වෘක්ෂ දේවතාවාට අවුරුද්දක් පාසා දහසක් අගනා බලිපූජාවක් කරන්නාහ. මෙසේ පූජා විඳ වසන ඒ දිව්‍ය පුත්‍ර එක් දවසෙක්හි සිතනුයේ "මේ රජ තෙම විචාරීමෙහි ප්‍රමාද ව ඡන්දයෙන් අගතියට ගොස් සත්ත්වයන්ට දුක් දී වසන්නේ ය. ඒ කාරණයෙන් සියලු රාජ්‍ය ම නසන්නේ ය. රාජ්‍යවාසීනුත් මේ දුක්ඛයෙන් මුදා මොහුත් පරලෝ භයින් ගළවා දැහැමින් රාජ්‍යය රකිනා ලෙස අවවාද දෙමි"යි දිව්‍ය පුත්‍ර තෙම රාත්‍රියෙහි රජු වැද හොත් ශ්‍රී යහන් ගබඩාවට වැද ඉස්දොර සමීපයෙහි සිට තමාගේ ශරීරයෙන් රන්වන් රැස් විහිදුවා ආකාශයෙහි සිටියේ ය. එවේලෙහි යහන ඔත් රජ්ජුරුවෝ ළහිරු කළබක් මෙන් දිලිසෙන දිව්‍ය පුත්‍රයා දක "මෙතැන්හි දිලිහි දිලිහි සිටිනා වූ තෝ කවරෙක්හි ද"යි විචාළ කල්හි ඉක්බිති රුක්දෙව් කියනුයේ, "රජ්ජුරුවෙනි, අවුරුදු පතා තොපගේ බලි ග්‍රහණය කොට මේ තිඹිරි ගස වසන්නා වූ වෘක්ෂ දේවතාවා නම් මමය. තොපට අවවාද දෙන පිණිස අයිමී" කියේ ය.

(i). රජුට අවවාද කිරීමට වෘක්ෂ දෙවතාවා පැමිණියේ ඇයි?

(ii). රාජ්‍යවාසීන් දුකට පත්වන්නේ කුමන හේතුවක් නිසාද?

(iii). රුක් දෙවියා රජුට පෙනී සිටියේ කෙබඳු ආකාරයටද?

(iv). 'රුවන් රැස් විහිදුවා' යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණය කුමක්ද?

(ඊ)

තනා පබළු මිණි අභරණ පැළඳ
පිනා සඳලුවල සිටි පුරගනෝ ළඳ
මනා ළපලු පත්මල් පල ගෙන නොමඳ
කනා ලියන් වැනි රඳී රන්ගිරි බෙයඳ

පියකරු තෙනෙත් පැරදී පිවිසි වන විල
පිවිතුරු හසුන් එන ලෙද යළිගෙන දිගු විල
විසිතුරු මෙපුරවර අඟනන් වෙමින් ලොල
පියයුරු පටින් බැඳ වසතියි සිතේ බල

1 මෙපුර කාන්තාවන් සැරසී සිටියේ කෙසේද ?
2 පුරඟනන් හා කනාලියන් අතර සමානත්වයක් දක්නට ලැබෙන්නේ කෙසේදැයි දක්වන්න.
3 ගෙදිගු විල හංසයන් වනවිල් කරා ඇදි ගියේ ඇයි ?
4 පියයුරු පටින් බැඳ වසතියි සිතේ යන යෙදුමෙහි කාව්‍යාලංකාරය දක්වන්න.

(උ) පහත සඳහන් උද්දෘත අතුරෙන් හතරක් තෝරාගෙන අවස්ථා සම්බන්ධය ලියන්න.

i,

01- තොප කළ සේ නොයෙදෙයි මිත්‍රද්‍රෝහ නම් යහපත් දෙයක් නෙවෙයි
02- තොපගේ අදහස විශාරද නියාව අවදී නොහැ නොහැගුණත් දූනුත් නොහැගේද
03- මේ කැඳින් මදක් අනුභව කළ ඇසිල්ලෙහි ගොළුවෝ කථා කෙරෙති
04- මේක නැති වුණදාට මමත් ඉවරයි කියලා හිතා ගන්න
05- වරද්දල තේරුම් ගන්ඩ එපා අද මගේ ඔළුව කකියනවා

ii. පහත සඳහන් පද පන්තිය පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

2016. 12. 01
13 ශ්‍රේණිය
සිංහල.

Learning Resource Center
R
De Mazenod College
Kandana

මගෙ බිසවුනේ අසාපත්
නුඹ මන්ත්‍රී දේවී නොවුණේ
මේ කඳුළු ඇයිද දෑසේ
බෑ යන්ට නුඹට හිමයේ
විෂඝොර සර්ප භවනේ
නවතින්න කුලී නිවසේ
මේ කර්ණ කටුක නගරේ
පොඩි උන්ව බලාගන්ඩයි
ඉස්කෝලේ එක්ක යන්ඩයි
ලෙඩ දුකට පිහිට වෙන්ඩයි
කුනු බැනුම් අසාගන්ඩයි
දිව විකා බර අදින්ඩයි
නවතින්න බිසවු නගරේ
මේ කුලී මාලිගාවේ
කිරි ශිරාවෝ සියයක් ඉල්පී
කෘෂ ළැමට ඇදී එත් මැයි
පියයුරෝ දෙදෙන හොරැහින්
බිම බලාගෙන හඬත්මැයි
ලේ කඳුළු බිංදු නොසිදී
ළැම දුකික් තෙත් කරත්මැයි
හාමතේ නොලා මෙදරුවන්
රක්ෂා කෙරෙත්මැයි
මට යන්ට දෙන්න දේවී
ඒ දුෂ්කර පළාතේ
බෙලිකටින සතුන් අතරේ
කෙළ ගසන සතුන් අතරේ
මිනිසුන් ද වැඩ වසන්නේ
බෝ ප්‍රවේසම්ව ඉන්නම්
මගේ මෙහෙය මම කරන්නෙම්
අත පුරා මගේ දෝතින්
ජීවිතය ගෙනැත් දෙන්නම්
නුඹ නොදෙම් එතෙර රටටා
දරු නොදෙම් වාල් කමටා
ඇඟ මස පුදා රකිම් මැයි

නොපුරම් එහෙත් පෙරුම් දම්
බුදු වන්ට ඕන නුඹලා
මට නිවන් මඟ කියල්ලා
නුඹ චන්ද්‍ර මඬල වැන්නේ
සා පැටවු එහි නිදන්නේ
හිමවතට ඇවිත් හීනෙන්
සිත සඳුන් තවරාපන්නේ

(03) අප ජීවත්වන මානව සමාජය වඩා යහපත් සමාජයක් කර ගැනිමෙහිලා සද්ධර්මරත්නාවලි කෘතියෙන් ගත හැකි ධර්මෝපදේශ මොනවාදැයි ආදාළ කතා වස්තු දෙක ආශ්‍රයෙන් නිදසුන් දෙමින් විස්තර කරන්න.

නැතහොත්

ජාතක කතා කරුවා මිනිස් සිත විනිවිද දකිමෙහි සමතෙකි නිදසුන් දෙමින් විස්තර කරන්න.

(04) සද්ධර්මාලංකාරය කෘතියෙන් ආර්ථික හා සමාජ තොරතුරු රැසක් පිළිඹිබු කරයි. අදාළ කතා වස්තු නිදසුන් කොට ගනිමින් විස්තර කරන්න.

(05) මළගිය ඇත්තෝ නවකතාවෙන් සමජයන් දෙකක සංස්කෘතික වෙනස්කම්වලට මැදි වූ චරිතවල විවිධ ලක්ෂණයන් නිරූපණය කරයි නිදසුන් දෙමින් විස්තර කරන්න.

(06) නූතන කවියා සම්ප්‍රදායික වස්තු විෂයෙන් බැහැරව අනුභූතින් තෝරා ගැනීමට දරණ උත්සහය නිදසුන් පද පංති තුනක් මගින් විස්තර කරන්න.

(07) ''ගිරා සන්දේශ කවියාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය විවිධ වර්ණනාවන්හි කැපී පෙනෙයි '' මෙම අදහස වර්ණනා දෙකක් ආශ්‍රයෙන් විස්තර කරන්න .

(08) රත්නාවලි නාට්‍යයේ නාට්‍යය උචිත අවස්ථා නිදසුන් දෙමින් විස්තර කරන්න.

ද මැසිනොද් විදුහල කඳාන

De Mazenod College - Kandana

# සිංහල භාෂාව II

පැය 3

1.12.2016

13 ශ්‍රේණිය

I කොටසේ 1 වන ප්‍රශ්නයටද II කොටසේ 2,3, ප්‍රශ්නද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1) එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

01- අන්තඃස්ථාක්ෂරසේ සැලකෙන්නේ කවරක්ද ?
(1) ඞ, ඤ ණ,න,ම
(2) ක,ච,ට,ත,ප
(3) ග,ජ,ඩ,ද,බ
(4) ශ,ෂ,ස,හ,ෆ
(5) ය,ර,ල,ව

02- නිවැරදි අක්ෂර වින්‍යාසයය සහත පද පේළිය තෝරන්න.
(1) අරුණෝදය. ප්‍රෞඪ, කණිෂ්ඨ, මර්ධනය
(2) ආස්වාදය, ලේඛණ, කොට්ඨාශ, ආස්වාද
(3) අභිනිෂ්ක්‍රමණ, අරුණළු, අදෘශ්‍යමාන, ධර්මිෂ්ඨ
(4) සමස්ත, ආකර්ෂණ, අනර්ඝ, අනුස්මරන
(5) අනපේක්ෂිත, අන්‍යෝන්‍ය, ශිෂ්ඨාචාරය, අලුයම

03- ආකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පේළිය තෝරන්න.
(1) කොළඹ, ගාල්ල, අනුරාධපුරය, මාතර
(2) දඹුල්ල, කැකිරාව, මොරටුව, මාතලේ
(3) මැදවච්චිය, කිලිනොච්චිය, වවුනියාව, යාපනය
(4) කන්කසන්තුරේ, හිට්ටඹුව, පෙරාදෙණිය, මහනුවර

04- පහත සඳහන් වර්ණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඊ පසුව යංශය නොයෙදේ
(2) රේඵය වෙනත් වර්ණයක් සමඟ නොයොදා තනිවම යෙදිය හැකිය
(3) රේඵය වෙනුවට රකාරාංශය භාවිතා කළ හැකිය
(4) වචනයක ආරම්භක අක්ෂරය ලෙස රේඵය භාවිත කළ හැකිය
(5) රේඵය සැම විටම දන්තජ අක්ෂරයක් සමඟ භාවිතා කළ යුතුය

05- පෞරාණික සිද්ධාස්ථාන රැක ගැනීම සඳහා අපි සැමවිටම දිරිමත් වෙමු. යන්නෙහි වචන යෙදී ඇති අනුපිළිවෙල තෝරන්න.
(1) සමාස, නිපාත, තද්ධිත
(2) තද්ධිත, නිපාත, තද්ධිත
(3) තද්ධිත, නිපාත, සන්ධි
(4) නිපාත, සන්ධි, තද්ධිත
(5) තද්ධිත, සන්ධි, නිපාත

06- අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) මුවකු, තෝ, මවක, ඉබ්බෙක්
(2) කන්‍යාවක්, මුරයකු, දූවක්, හිඟන්නෙක්
(3) අයෙක්, විද්‍යාචක්‍රවර්තීන්, ගිරවුන්, තාපසයෙක්
(4) විදේශකයෝ, රිතිහු, මා, ගැරඩියෙක්
(5) පියුම්හු, ධීවරයන්, බිහිරෝ, ගොවිහු

07- කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) බැල්ලි, කැවිලි, දැවිලි, පැටලිලි
(2) උතුරන, මතුරන, පතුරන, වගුරන
(3) ශ්‍රවණීය, වරණීය, කරණී, චන්දනීය
(4) කපන, කොටන, පෙරන, මිරිකන.
(5) නැටූ, බටූ, වාටූ, දුටු

08- මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මිතුරු - තුරු, පසමිතුරු, අමිත්‍ර, ශත්‍රු
(2) මුකුලිත - විකසිත, පිපුණු, මිණිමුතු, මලින
(3) කම්පිත - නිශ්චල, අකම්පිත, අචල, නොසැලෙන
(4) භාග්‍ය - දුර්භාග්‍යය, අවාසනාව, අභාග්‍යය, කාලකණ්ණිකම

09- උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) සුදන, දුදන, විමල, නිර්මල
(2) අවමාන, නිරහංකාර, ප්‍රබල, උපකාර
(3) අස්ථිර, අබල, අදුර, අපල
(4) අනුමාන, ආගමන, අසරණ, අවවාද
(5) සාතිශය, විශිෂ්ට, අපවාද, සුසිල්වත්

10- ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) නටා, ගයා, බලා, අකුණ
(2) බලන, නටන, කියන, ගයන
(3) නටමින්, බලමින්, ගයමින්, සොයමින්
(4) නිසා, උදෙසා, සහ, කැටුව
(5) මව්පිය, අඹුසැමි, ගම්බිම්, තිසරණ

11- එකම වර්ගයකට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) සරතැඟිලි, රතුපුල්, කන්‍යාරාමය, ගුණැති
(2) නුවනුපුල, සහසැස්, නරේන්ද්‍ර, පූජාසන
(3) පංචේන්ද්‍රිය, නරේන්ද්‍ර, මහා නිශංස, සදාදරණීය
(4) ගංවතුර, නෙළුම් මල්, අම්මල්, ලිංපඩිය
(5) දකුණත, වමත, ගංවතුර, බහ්වර්ථ

12- ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.
(1) දෙමාපියන් එනාහි දරුවන් ගැන වෙහෙසෙන්නෝ වෙති.
(2) ඒ පාසලෙහි ගුරුවරුන් නැත
(3) ඔවුන් නවු මඟට බසිතියි මම සිතමි
(4) කවුරු මෙවැනි ක්‍රියාවෝ කරත්ද ?
(5) සභාපතිතුමා විසින් ලසුලේඛිකාවක් තොරා ගන්නා ලදි

13- තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) මරණ, සරණ, චරණ, පරණ
(2) නිරිඳු, මිහිඳු, දෙවිඳු, තරිඳු
(3) අත්ත, දත්ත, ප්‍රාන්ත, භ්‍රාන්ත
(4) කාල, තාල, බාල, රාළ
(5) ධන, මන, දින, පණ

14- පහත සඳහන් ප්‍රකාශවල ඉරි ඇති වචනවල ක්‍රියා වර්ගය පිළිවෙළින් වන්නේ,
අ. <u>එව</u> කව බොව
ආ. සගසිරි, <u>අසාලා</u>
ඇ. <u>කියමින්</u> ගී රස මියුරු
ඈ. කල් වැසි <u>වසීවා</u>

(1) විධික්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(2) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා
(5) මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා

15- යංශය, රකාරාංශය රේඵය හා ගයනු කිත්ත සහිත වචන පිළිවෙලණි යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ප්‍රථම, සෞඛ්‍ය, වෛද්‍ය,
(2) ප්‍රවර, ලෞකික, කාව්‍යාද, ගීය, අමනුෂ්‍ය
(3) ග්‍රහයා, ප්‍රත්‍යය, ඖෂධ, ධර්මය
(4) චක්‍රය, අද්‍යතන, මූලාශ්‍රය, භෞමික
(5) විභක්ත්‍යර්ථ, සම්ප්‍රදාය, වර්ගය, පෞරාණික

1 . 12 . 2016

Learning Resource Center R De Mazenod College Kandana

16- සමාස පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) අනදර, අනිටු, අනුබල, සුසිරිත්
(2) සිසිල්පැන්, තුන්දොර, ඇස් ඉස්මස්, ගී නැටුම්
(3) ගල්හිත, පසැස්, කුශලතා, අසුර
(4) කහබත්, අසරණ, දුර්ජන, හාමස්
(5) නිල්වල, පාතඹර, තුන්ලෝ, සුරිඳු

17- පහත සඳහන් වර්ණ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කොම්බුව දෙක සිංහලයේ ඖ කාරය වෙනුවට ව්‍යඤ්ජනයකට මුලින් පමණක් යෙදෙයි
(2) කොම්බු දෙක සිංහලයේ ස්වරයක මුලට පමණක් යෙදෙයි
(3) කොම්බු දෙක සඳහා ගයනුකිත්තද යෙදිය හැකිය
(4) කොම්බු දෙක සිංහලයේ ඓ කාරය නියෝජනය වීම සඳහා ව්‍යඤ්ජනයකට මුලන් පමණක් යෙදෙයි
(5) කොම්බු දෙක යෙදිය හැක්කේ ඓ කාරයට මුලින් පමණි

18- එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විහාර මන්දිරය, භාරත දේශය, රාජ සභාව, ඇමති මන්ඩලය,
(2) ඡන්දස් ශාස්ත්‍රය, අලංකාරවාදය, ස්වභාවදහම, වෛද්‍ය මධ්‍යස්ථානය
(3) හිරුමඬල, විදුලි ආලෝකය, සුබ මංගලම්, තිරිය විධි
(4) ස්තූප වංශය, මූල්‍ය ප්‍රතිපාදන, ආරක්ෂක අමාත්‍ය,සෞඛ්‍යය මධ්‍යස්ථානය
(5) ශීල ව්‍යාපාරය, යෝජනා ක්‍රමය, ලංකාද්වීපය, බඹ ලෝකය

19- අව්‍යය, විශේෂණ, විභක්ති, අන්‍යර්ථ, යන සාමසවලට අයත් පද පිළිවෙලින් දක්වා ඇති පද පේළිය තෝරන්න.
(1) සුදන, දසපනත. ගත්කරු, දිනකර,
(2) තිලෝ, සුන්බත්, පොල් තෙල්, ප්‍රබල,
(3) නිල් අඹර, දම්දූරු, නිවහල්, මිහිඳුම්
(4) ලබසවන්, රතුපුල්, ප්‍රබුද්ධ, රත්කම්
(5) අනදර, සඳවන්, සියපත්, තැඹිලි තෙල්

20. **වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.**
(1) **කෞතුකාගාරයකින් ස්ව දේශයේ ප්‍රෞඪත්වය පිළිබඳ මනාඅවබෝධයක් ලදහැකි ය.**
(2) **තාක්ෂණික උපකරණභාවිතය මිනිසා අකාර්යක්ෂ ම කිරීමට හේතුවේ.**
~~(3) **සිංහලභාෂාවර්ධනය හා සම්බන්ධ ප්‍රමුඛත ම කාර්යභාරයක් හෙළසවුලෙන් සිදුවිය.**~~
(4) **මවුපියදූදරු සම්බන්ධය ගිලිහීයාම සමාජප්‍රගමනයට අහිතකර වූව කි.**
(5) **සිංහල සාහිත්‍ය ඥානයෙන් පෝෂණය වූ ප්‍රජාවක් අතීතයෙහි අප රටෙහි විසූහ.** (……)

(ලකුණු 20 යි.)

Learning Resource Centre
De Mazenod College
Kandana

## II කොටස

02. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුපිළිවෙළින් ලංකාවේ රාජධානි බවට පත් වූ **පුරප්‍රවරයන්ගේ** නම් අනුව සිංහල සාහිත්‍යය ද සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදේ. මේ යුග වෙන වෙන ම **තුලනාත්මක** පරීක්ෂණයට භාජන කිරීම මෙහි දී අවශ්‍ය නො වේ. එසේ වුව ද අනුරාධපුර යුගයට අයත් වන පද්‍ය සාහිත්‍යය වශයෙන් සීගිරි පවුරු ගී ද කාව්‍යාලංකාර ග්‍රන්ථයක් වන සියබස්ලකර ද හැර අන් කිසිදු කෘතියක් දක්නට නො ලැබෙන බව මෙයි දී සඳහන් කළ යුතු ය. සීගිරි ගීවල දක්නට ලැබෙන කාව්‍ය ආකෘති සිය පබැඳුම්හි යොදා ගත්තෝ විරලය හ. ඉනුදු අප දන්නේ පසු කාලයෙහි ඇති වූ කවීන් තිදෙනෙකු පමණි. ඔවුහු නම්, ගී කාව්‍ය නමින් ව්‍යවහාර ලැබූ ආඛ්‍යාන කාව්‍ය තුනෙහි කර්තෘවරු ය. කව්සිළුමිණ, සසදාවත, මුවදෙව්දාවත යන මේ කාව්‍ය තුන පරීක්ෂා කර බලන විට කවීන් තිදෙන ම සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනයෙහි ලා නොමඳ ව නියැළී ඇති බව හෙළි වෙයි. සංස්කෘත බලපෑමට නතු වූ ගී කාව්‍ය කර්තෘවරු දේශීය ලක්ෂණ විරල වූ ගතානුගතික කාව්‍ය වර්ණනා පබැඳූ හ. ඔවුහු ස්වභාව ධර්මය කෙරෙහි මහත් අභිරුචියක් දක්වූ නමුත් ස්වකීය දේශීය පරිසරයෙහි දක්නට ලැබුණු ස්වභාව සෞන්දර්යයෙන් ප්‍රබෝධයක් ලැබූ බවක් සිය පබැඳුම්න් ස්ඵුට නො කරති. සංස්කෘත කාව්‍යයෙහි හමු වූ ප්‍රකාශන ක්‍රම සහ විවිධ අලංකාර රීති ද ඔවුහු ලැදි ව අනුගමනය කළ හ. රජුන්, රැජිනන්, නගර, උත්සව, ස්වභාව වස්තූන් ආදිය පිළිබඳ ඔවුන්ගේ අනේකවිධ වර්ණනා සියල්ල ම සම්පූර්ණයෙන් ම වාගේ ඒකාකාර ය. වෙනසක් පෙනෙන්නේ උපමා ඇතුළු අලංකරණ සකස් කර තිබෙන ආකාරයෙහි පමණි.

(i) ගී කාව්‍යයන්හි ඒකාකාරිත්වය හා වෙනස්කම් මතුවන්නේ කවර අංග ආශ්‍රිත ව ද?

(ii) ගී කාව්‍ය කතුවරුන් සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනය කළ බව තහවුරු වන්නේ කවර කරුණු නිසා ද?

(iii) සීගිරි ගී සහ සියබස්ලකර පිළිබඳ ව සඳහන් කිරීමෙන් ලේඛකයා තහවුරු කරන්නේ කුමක් ද?

(iv) මෙම ඡේදයේ සඳහන් අන්දමට සිංහල සාහිත්‍යය සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදා ඇත්තේ කුමක් පදනම් කරගෙන ද?

(v) **පුරප්‍රවරයන්** හා **තුලනාත්මක** යන වචනවල අරුත් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) පහත දක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නො දක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අධ්‍යාපනය සමාජ වෙනස්වීම් සඳහා සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තවද, ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද, නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් සහ ඇගයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කර ලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද, අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරා ම නායකත්වය පිළිබඳ විවිධ රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධනය හා සම්බන්ධ සමාජ සහ දේශපාලන සාධක දන්නා තරමට ම, සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන ද දැන ගත යුත්තෝ ය.

අධ්‍යාපනය ශුභසාධන අංගයක් වශයෙන් නො ව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කර ගත යුතු ය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින් ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩගස්සා ගත යුතු බව යි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂකම් ඇතියවුන් නියත වශයෙන් ලබා දීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වූත්, විද්‍යාත්මක වූත් හැඟීමක් ඇතිකර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙ වැනි අවශ්‍යතාව ඉතා ම වැදගත් වෙයි. කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබාගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි.

(ලකුණු 15 යි)

(03) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 300ත් 350ත් අතර වනසේ ව්‍යාකරණානුකූල රචනාවක් ලියන්න.

01 සංහිඳියාව සහ ජාතීන් අතර පවතින සමගිය
02 රටක ජන මාධ්‍ය සතු කාර්ය භාර්ය
03 වන සම්පත සුරැකීමේ වැදගත්කම
04 පොත්පත් කියවීමේ සාමාජයක් ගොඩ ගැනීමේ වැදගත්කම
05 රටක සංවර්ධනයට සාහිත්‍ය කලාවන්හි දායකත්වය
06 [illegible]

4

(ආ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරක වාක්‍යවලට හරවා ලියන්න.

(i) මහාචාර්ය සරච්චන්ද්‍රයෝ "මනමේ" නාටකය ලියූහ.

(ii) ජනමාධ්‍යවේදීහු ග්‍රාහකයන් දැනුවත් කරති.

(iii) ඇමතිතුමාණෝ නව ලේකම්වරියක පත් කළහ.

(iv) රසිකයෙක් සාදරයෙන් අමරදේවයන් පිළිගත්තේ ය.

(v) මගේ නෑදෑයෝ මා අමතක කළහ.

(අ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) ශ්‍රී ලාංකිකයෝ චිනාහි පාරම්පරික සංස්කෘතියක ප්‍රෞඪ උරුමක්කාරයන් වෙති.

(ii) අනාගත නායකයන් බුද්ධිමතුන් වේවා!

(iii) භාෂාවේ එන ප්‍රයෝගයන් කලින් කලට වෙනස් වේ.

(iv) ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයෝ කිසිදාක පරදිතියි ක්‍රීඩා ලෝලීන් නොසිතූහ.

(v) සැකකරුවන් පොලිස් විමර්ශන කාර්යාංශ මූලස්ථානයෙහි රඳවනු ලැබිණි.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීමට සුදුසු පදය වරහන තුළින් තෝරා ලියන්න.

01 අම්මාද අක්කාද මමද ගමට ( ගියෙමි / ගියෙමු )
02 පෙර ( දනවතුන් / දනවත්තු ) වූ ඔහුවූ අද අසරණව සිටිති.
03 ( වෛද්‍යවරුන් / වෛද්‍යවරු ) හෙට රෝහලට පැමිණේවී.
04 මව එක් පුතෙකු වෛද්‍යවරුයෙකු ( කළේය ( කළාය )
05 ( අපි / අප ) උනන්දුවෙන් වැඩ කළ යුතුය.

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) සමාජ අසාධාරණය නිසා සමහරු **අපේක්ෂාභංගයට** පත් වෙති.

(ii) **ලලනාධිපත්‍ය** සංකල්පය ද සමාජ ප්‍රගතියට අහිතකර ය.

(iii) ඇතැම්හු **පරවාදඛණ්ඩනයට** පමණක් උත්සුක වෙති. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) තමා උසස් සේ සැලකීම

(ii) දත් හා තොල් ආශ්‍රය කොට ගෙන හටගන්නා (අක්ෂර)

(iii) රාත්‍රියෙහි සැරි සරන (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) ධාවන .............................. මේරියන් ජෝන්ස් ලෝකප්‍රකට තැනැත්තියකි.

(ii) අන්‍යයන්ගේ වැරදි දෙස බලන විට ඔහුගෙන් සිදු වූ වරද ඉතා .............................. ය.

(iii) සුරා ධූර්තයෝ .............................. ශාලාවට ප්‍රවිෂ්ට වූ හ.

(iv) උපාධි ප්‍රදානෝත්සවයේ දී එක් ශිෂ්‍යයෙක් කලා .................... උපාධිය හිමි කර ගත්තේ ය.

(v) පාරිභෝගිකයෝ උත්සව සමයෙහි .............................. ශාලාවලින් ආහාර පාන ගනිති.

(vi) මේ මාර්ගය ලිස්සන .............................. ය. (ලකුණු 03 යි.)

(සුලු/සුළු/ ආපාන / ආර්ණ / සූරි/ශූරී)

(ඊ) **තද කළු අකුරෙන් දක්වා ඇති බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) ගොවියා **විස** පානය කොට මිය ගියේ ය.

(ii) ඔහුගේ මුවින් පිට වූ **වදන** සිතට වේදනා ගෙන දෙන්නකි.

(iii) **පිය** සෙනෙහස ද මව් සෙනෙහස මෙන් ම අගනේ ය.

(iv) වැවෙහි **දිය** දහර කෙත්බිම් සරු කෙළේ ය.

(v) **පිල** නොකියා පලා බෙදනවා වගෙයි.

(vi) **අදර** විබත යන්න ම ආධාර විභක්ති යන නාමයෙන් ද හැඳින්වේ. (ලකුණු 06 යි.)

(ලකුණු 06 යි)

6. තද කළු අකුරෙන් දී ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට හා අනු අංගයකට අයත් දැයි දක්වන්න.

(i) **ඕෂ්ඨයන්** ක්‍රීඩා පිටියට **පිවිසෙද්දී තදින්** වෙහෙවන්නට විය.

(ii) දහවල් **දොළහෙන්** පසු **භෝජනාගාරය මිනිසුන්ගෙන්** පිරී ගියේ ය.

(iii) ගසක් මුලට **වී** විඩාව **සංසිඳුවා** ගත් මගියා **යළිත්** ගමනාරම්භ කළේ ය.

(iv) මලල ක්‍රීඩාවේ දී **රන්පදක්කම** දිනූ මගේ මිත්‍රයා මහමගට පිවිසි **උන්මත්තකයෙකු මෙන්** දුවන්නට විය.

(v) **අගරු** චෙක්පත් **නිෂ්කාශනය** කරන්නැයි **බැංකුකළමනාකරු** සේවකයන්ට පැවසී ය.

(ලකුණු 15 යි)

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) ධන හීනයකුට හදිසියෙන් ලැබෙන ලාභය

(ii) සුළු ලාභයක් නිසා වැඩි අලාභයක් නොසලකා යමක් කිරීම

(iii) උත්සාහය ඇත්නම් ජය ලබාගත හැකි ය

(iv) කෙනෙකුගේ අය මාර්ග සම්පූර්ණයෙන් ම වසා ගැනීම

(v) අයහපත් කාලයෙහි ස්වකීය ඥාතීන්ගෙන් වෙන් ව වාසය කිරීම

(vi) උවමනාවට වඩා උඩඟු වීම (ලකුණු 03 යි)

(ආ) පහත දී ඇති රූඪිවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

(i) තොරතෝංචියක් නැති

(ii) උරචක්‍රමාලය

(iii) දෙහි කපනවා

(iv) මූණෙ දැලිගානවා

(v) හිල් කුඩෙන් වතුර ඇදීම

(vi) පලිප්පු දමනවා (ලකුණු 03 යි)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පදය සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

(i) ආචාර සමාචාර

(ii) අතන මෙතන

(iii) අනම් මනම්

(iv) ඉඩම් කඩම්

(v) බත් බුලත්

(vi) මැහුම් ගෙතුම් (ලකුණු 03 යි)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(i) කණිසම

(ii) කුණ්ඩ හට්ටිය

(iii) සුනංගු

(iv) බුන්නා

(v) බූඩා

(vi) කුයිල (ලකුණු 03 යි)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

(i) කලවිට

(ii) උප්පිච්

(iii) පන්නෙ ගහනවා

(iv) වළාලය

(v) කෝසු කරනවා

(vi) බෝල් අත්ත (ලකුණු 03 යි)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බටහිරඉන්දියාවෙන්ලංකාවටසංක්‍රමණයවූආර්යයන්රටතුළටගමන්කොටඇත්තේත්වාසයටතෝරාගෙනඇත්තේත්ගංගාආශ්‍රිතප්‍රදේශබවපැහැදිලිකරඇතමේබවමහාවංශයේඑනතොරතුරුවලටඅමතරවශිලාලේඛනසෙල්ලිපිලැබීඇතිස්ථානපරීක්ෂාවෙන්දනිගමනයකළහැකියමුලින්තම්බපණ්ණිනගරයදදෙවනුවඋපතිස්සනගරයදඅනුරාධපුරයදදියුණුනගරබවටපත්වියතම්බපණ්ණිනගරයමල්වතුඔයආශ්‍රිතවදඑහිශාඛාවක්වූකණදරාඔයඅසබඩඋපතිස්සග්‍රාමයදපිහිටාතිබේකලාඔයේමෝයඅසලඋරුවෙලානගරයපිහිටාඇතඋදේනිගමකුමනස්ථානයකපිහිටාතිබෙන්නටඇත්දැයිදැනටඇතිසාධකමගින්තහවුරුකරගතනොහැකිවීඇතත්එයගංගාවක්ආශ්‍රිතවපිහිටන්නටඇතැයිසිතියහැකියදැනටලැබීඇතිසෙල්ලිපිවැඩිප්‍රමාණයක්මල්වතුඔයකලාඔයදැදුරුඔයහාමහඔයයනප්‍රදේශවලින්ලැබීඇතිබැවින්මේප්‍රදේශවලමුල්ආර්යයන්ජනපදපිහිටුවාගන්නටඇතැයියන්නස්ථිරවේමුල්ආර්යයන්රටඇතුළටගමන්කරඇත්තේමේඔයවල්දිගේයැයිපැහැදිලිවේ

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) ඌෂ්මාක්ෂරයක් සහ මූර්ධජ අක්ෂරයක් සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) ඡේදයේ ඇති "තොරතුරු" යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.

(iv) රකාරාංශය හා ඉස්පිල්ල එකට යෙදී ඇති පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.

(v) බැඳි අකුරක් හා රේඵයක් යන දෙක ම අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.

(ලකුණු 15 යි)